[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය මතුගම අධ්‍යාපන කලාපය මතුගම අධ්‍යාපන කලාපය මතුගම අධ්‍යාපන කලාපය මතුගම අධ්‍යාපන කලාපය

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2023

11 ශ්‍රේණිය	ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය	පත්‍රය I	පැය - 03 යි.

නම/පන්තිය/විභාග අංකය : ....

සැලකිය යුතුයි :-

✷ සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

✷ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 40)

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 01 සිට 05 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

අහිතකර ආහාර භාවිතය තුළින් රටේ ජනතාව අතර පැතිරෙන ලෙඩ රෝග පිළිබඳව මනා අවබෝධයක් ඇති පොළොන්නරුවේ පදිංචි පියදාස, තම ප්‍රදේශයේ වනාන්තර වලින් තමා විසින් ම සපයා ගන්නා ස්වාභාවික නැවුම් එළවළු හා පලතුරු අලෙවි කිරීමේ වෙළෙඳ සැලක් සේවකයෙකුගේ ද සහය ඇතිව ගල් විහාරය ආශ්‍රිත පූජා භූමියේ ආරම්භ කරන ලදී. මෙම පූජා භූමි වන්දනාව සඳහා පැමිණෙන සැදැහැවතුන්ගෙන් මෙම එළවළු හා පලතුරු සඳහා ඉහළ ඉල්ලුමක් ඇත.

01. පියදාසගේ ව්‍යාපාරය විසින් සපයන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක් ද?
    1. සෞඛ්‍ය   2. එළවළු සහ පලතුරු   3. ආහාර   4. ආරක්ෂාව

02. එළවළු හා පලතුරු අයත් වන නිෂ්පාදන සාධකය වන්නේ,
    1. භූමිය   2. ශ්‍රමය   3. ප්‍රාග්ධනය   4. ව්‍යවසාය

03. ඉහත සිද්ධියේ සඳහන් ව්‍යාපාර අවස්ථාවක් වන්නේ,
    1. රටේ ජනතාව අතර පැතිරෙන ලෙඩ රෝග පිළිබඳව පියදාසට අවබෝධයක් පැවතීමයි.
    2. සැදැහැවතුන්ගේ ස්වාභාවික නැවුම් එළවළු හා පලතුරු සඳහා පවතින ඉල්ලුමයි.
    3. පියදාස පොළොන්නරුවේ පදිංචි වී සිටීමයි.
    4. නැවුම් එළවළු හා පලතුරු පමණක් අලෙවි කිරීමයි.

04. මෙම ව්‍යාපාරය,
    1. සමූපකාරයකි.   2. කේවල ස්වාමි ව්‍යාපාරයකි.
    3. හවුල් ව්‍යාපාරයකි.   4. සංස්ථාපිත සමාගමකි.

05. පියදාසගේ ව්‍යාපාරයට පැමිණෙන ගනුදෙනු කරුවන්ගේ අරමුණක් වන්නේ,
    1. රැකියා උත්පාදනය යි.
    2. ප්‍රමාණවත් ලාභයක් ලැබීමයි.
    3. ගුණාත්මක එළවළු හා පලතුරු සාධාරණ මිලකට ලබා ගැනීමයි.
    4. සෞඛ්‍ය සම්පන්නව ජීවත් වීමයි.

06. ව්‍යාපාරිකයන්ට සිය අභිමතය පරිදි කටයුතු කිරීම සීමා කර ඇති බාහිර පරිසර සාධකය වන්නේ,
    1. ආර්ථික පරිසරයකි.   2. දේශපාලන පරිසරය යි.
    3. නෛතික පරිසරය යි.   4. තාක්ෂණික පරිසරය යි.

07. සිල්ලර වෙළෙඳාමේ ලක්ෂණයක් වන්නේ,
    1. නව භාණ්ඩ හඳුන්වා දීම.
    2. ඇතැම් විට ණයට භාණ්ඩ සැපයීම.
    3. පාරිභෝගිකයාට සමීප වීම.
    4. නිෂ්පාදන පිළිබඳව පාරිභෝගික ප්‍රතිචාර නිෂ්පාදකයාට දැක්වීම.

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

08. නීතිමය කටයුතු වලදී ආයතන ප්‍රධානියා සිය නිල නාමයෙන් පෙනී සිටිය යුතු ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,
1. තනි පුද්ගල ව්‍යාපාර
2. සංස්ථාපිත සමාගම්
3. රාජ්‍ය සංස්ථා
4. රාජ්‍ය දෙපාර්තමේන්තු

09. චෙක්පතක චුම්භක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවේ (MICR) ඇතුළත් අංකයක් නොවන්නේ,
1. චෙක්පත් අංකය
2. බැංකු ශාඛා අංකය
3. ඉන්වොයිස් අංකය
4. බැංකු ජංගම ගිණුම් අංකය

10. රක්ෂණයට සම්බන්ධ වන පාර්ශව අතරින් පළමු පාර්ශවය වන්නේ,
1. රක්ෂණාවරණය ලබා දෙන පාර්ශවය යි.
2. රක්ෂණාවරණය ලබන පාර්ශවය යි.
3. රක්ෂණ ගිවිසුමෙන් බලපෑමක් වන අනෙකුත් සියලුම පාර්ශවය යි.
4. ඉහත කිසිවයක් නොවේ.

11. සන්නිවේදන කටයුතු සඳහා යොදා ගන්නා සන්නිවේදන මාධ්‍යක් නොවන්නේ,
1. විද්‍යුත්
2. විද්‍යුත් තැපැල
3. ලිඛිත
4. සංකේත හා සංඥා

12. සුදුසු ප්‍රවාහන මාධ්‍යක් තෝරා ගැනීමේ දී සලකා බලන සාධක ඇතුලත් පිළිතුර නොවන්නේ,
1. පිරිවැය, ධාරිතාව, සුලභත්වය, වේගය
2. ධාරිතාවය, සුලභත්වය, වේගය, ආරක්ෂාව
3. සුලභත්වය, වේගය, ආරක්ෂාව, භාණ්ඩයේ ස්වභාවය
4. වේගය, ආරක්ෂාව, ධාරිතාවය, මාධ්‍ය සඳහා යොදා ගන්නා බලය

13. නිවාස ඉදිකොට අලෙවි කරනු ලබන ව්‍යාපාරයක පහත එක් එක් අවස්ථාවට අදාළ නිවැරදි කළමනාකරණ කාර්ය පිළිවෙළින් දැක්වනුයේ,
A - ඉදිකිරීම් කටයුතු මෙන්ම අලෙවි කටයුතු සිදු කරන ආකාරය තීරණය කිරීම.
B - සැලසුම් කළ පරිදි ගුණත්වයෙන් යුතු නිවාස ඉදිකර ඇති දැයි සොයා බැලීම.
C - නිෂ්පාදන කළමනාකරු හා අලෙවි කළමනාකරු තම සේවකයන්ට අවශ්‍ය තොරතුරු සහ උපදෙස් සැපයීම.
D - ව්‍යාපාරයේ ඉදිකිරීම් හා අලෙවි කටයුතු සඳහා කළමනාකරුවන් පත් කිරීම.
1. මෙහෙය වීම, පාලනය, සංවිධානකරණය, සැලසුම්කරණය
2. සැලසුම්කරණය, පාලනය, මෙහෙයවීම, සංවිධානකරණය
3. සැලසුම්කරණය, පාලනය, සංවිධානකරණය, මෙහෙයවීම
4. සැලසුම්කිරීම, පාලනය, මෙහෙයවීම, සංවිධානකරණය

14. ව්‍යාපාර අරමුණු අපේක්ෂිත අයුරින් ඉටු කර ගැනීම හඳුන්වන්නේ,
1. කාර්යක්ෂමතාවය යි.
2. සඵලදායකත්වය යි.
3. කළමනාකරණය යි.
4. සැලසුම්කරණය යි.

15. අලෙවිකරණ මිශ්‍රයේ ව්‍යාපාරිකයාට ආදායමක් ලබාදෙන එකම විචල්‍ය වන්නේ,
1. නිෂ්පාදිතය
2. මිල
3. ස්ථානය
4. ප්‍රවර්ධනය

16. ''හොන්ඩා (HONDA) සමාගම හිරු එළිය ගබඩා කරගත හැකි හිරු එළයෙන් ධාවනය වන මෝටර් රථයක් නිපදවීමට තීරණය කරන ලදී.'' මෙම ප්‍රකාශය තුළ ඇතුලත් කළමනාකරණ කාර්යය සහ අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,
1. සැලසුම්කරණය සහ මිල
2. සැලසුම්කරණය සහ නිෂ්පාදිතය
3. සංවිධානකරණය සහ නිෂ්පාදිතය
4. සංවිධානකරණය සහ මිල

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

17. ''වැඩි වීම හර'', ''අඩු වීම බැර'' යන ද්විත්ව සටහන් මූලධර්මය පිළිවෙලින් අදාළ වන ගිණුම් යුගලය අඩංගු පිළිතුර වනුයේ,
    1. කොමිස් වියදම් ගිණුම, කොමිස් ආදායම් ගිණුම
    2. ගොඩනැගිලි ගිණුම, බැංකු ණය ගිණුම
    3. ගැනිලි ගිණුම, මුදල් ගිණුම
    4. ගැණුම් ගිණුම, පොලී ආදායම් ගිණුම

18. ව්‍යාපාරයක ''ගැනිලි'' අයත් වන ගිණුම් වර්ගය වන්නේ,
    1. වත්කම් ගිණුම්   2. වියදම් ගිණුම්   3. වගකීම් ගිණුම්   4. හිමිකම් ගිණුම්

- **පහත සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 19 සිට 21 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
  - A - අයිතිකරු ප්‍රාග්ධනය ලෙස මුදලින් රු. 300 000 ක් ව්‍යාපාරයට යෙදවීම.
  - B - ණයට භාණ්ඩ ගැනීම රු. 60 000
  - C - අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි රු. 5 000
  - D - අයිතිකරුගේ නිවසේ විදුලි බිල රු. 3 000 ව්‍යාපාරයේ මුදලින් ගෙවීම.
  - E - රු. 30 000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු. 50 000 කට ණයට විකිණීම.

19. ඉහත ගනුදෙනු අවසානයේ දී ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය (වත්කම් = හිමිකම් + වගකීම්) වනුයේ,
    1. 377 000 = 317 000 + 60 000   2. 372 000 = 312 000 + 60 000
    3. 402 000 = 342 000 + 60 000   4. 372 000 = 300 000 + 72 000

20. ඉහත ගනුදෙනු අතුරින් ව්‍යාපාරයේ හිමිකම වැඩි වීමට බලපාන ගනුදෙනු ඇතුලත් පිළිතුර වනුයේ,
    1. C සහ E   2. A සහ D   3. B සහ C   4. A සහ E

21. ඉහත සියලුම ගනුදෙනු අවසානයේ දී (A,B,C,D සහ E ගනුදෙනු වලින් පසුව) අයිතිකරු සිය පෞද්ගලික මුදලින් ණය හිමියන්ට රු. 50 000 ක් ගෙවූ විට ව්‍යාපාරයේ අවසාන ගිණුම්කරණ සමීකරණය වනුයේ,
    1. 322 000 = 312 000 + 10 000   2. 372 000 = 312 000 + 60 000
    3. 372 000 = 362 000 + 10 000   4. 322 000 = 212 000 + 110 000

22. මෝටර් රථ වෙළෙඳාමේ යෙදෙන **''මෝටර් රථ ආනයන සමාගම''** (Vehicle Import company) සිය කාර්යාල ප්‍රයෝජනය සඳහා ඉන්ද්‍රා ට්‍රේඩර්ස් වෙතින් මෝටර් රථයක් රු. 5 000 000 කට මිලට ගනී. මෙම ගනුදෙනුව මෝටර් රථ ආනයන සමාගමේ පොත් වල සටහන් කරන ආකාරය (ද්විත්ව සටහන) වන්නේ,
    1. ගැනුම් ගිණුම හර (රු) 5 000 000
       මුදල් ගිණුම බැර (රු) 5 000 000

    2. මෝටර් රථ ගිණුම හර (රු) 5 000 000
       මුදල් ගිණුම බැර (රු) 5 000 000

    3. මුදල් ගිණුම හර (රු) 5 000 000
       විකුණුම් ගිණුම බැර (රු) 5 000 000

    4. මෝටර් රථ ගිණුම හර (රු) 5 000 000
       ඉන්ද්‍රා ට්‍රේඩර්ස් බැර (රු) 5 000 000

23. ණය ගැතියෙකුගෙන් ලැබී තිබුණු රු. 25 000 ක චෙක්පත බැංකු ගිණුමේ තැන්පත් කළ පසු අගරු විය. එම අගරු වීම සටහන් කිරීමේ දී තැබිය යුතු නිවැරදි ද්විත්ව සටහන වනුයේ,
    1. බැංකු ගිණුම හර (රු) 25 000
       ණයගැති ගිණුම බැර (රු) 25 000
    2. බැංකු ගිණුම හර (රු) 25 000
       මුදල් ගිණුම බැර (රු) 25 000

    3. ණයගැති ගිණුම හර (රු) 25 000
       බැංකු ගිණුම බැර (රු) 25 000
    4. මුදල් ගිණුම හර (රු) 25 000
       බැංකු ගිණුම බැර (රු) 25 000

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

24. ව්‍යාපාරයක මුදල් පොතේ හර පැත්තේ වට්ටම් තීරුවේ එකතුව අදාල ගිණුමේ සටහන් කිරීම දැක්වෙන ද්විත්ව සටහන් රීතිය වන්නේ,
    1. වියදම් වැඩිවීම හර
    2. ආදායම් වැඩි වීම බැර
    3. වියදම් අඩු වීම හර
    4. හිමිකම් අඩු වීම හර

25. පොදු ජ'නලයේ සටහන් කරන ගනුදෙනුවක් නොවන්නේ,
    1. වැරදි නිවැරදි කිරීමේ සටහන්
    2. මුදල් ගැනිලි
    3. භාණ්ඩ ගැනිලි
    4. ජංගම නොවන වත්කම් ණයට ගැනීම.

26. සුළු මුදල් පොතක, ලෙජර ගිණුම (වෙනත් ලෙජර ගිණුම්) තීරුවේ ඇතුලත් කරනු ලබන ගනුදෙනු ඇතුලත් නිවැරදි පිළිතුර වන්නේ,
    1. ගෙන ඒමේ කුලී, ගමන් වියදම්, ණයහිමියන්ට (විමුක්තිට) ගෙවීම්
    2. ණය හිමියන්ට (විමුක්තිට) ගෙවීම්, ගෙන ඒමේ කුලී, සුළු වටිනාකම් සහිත වත්කම් මිලට ගැනීම්
    3. ගෙන ඒමේ කුලී, ත්‍රී රෝද රථ ගාස්තු, සුළු වටිනාකම් සහිත වත්කම් මිලට ගැනීම.
    4. සුළු වටිනාකම් සහිත වත්කම් මිලට ගැනීම්, ගෙන ඒමේ කුලී , පිරිසිදු කිරීමේ වියදම්

27. ව්‍යාපාරයක 2023.09.01 දිනට සුළු මුදල් ශේෂය රු. 400 ක් විය. සැප්තැම්බර් (09) මාසයේ සුළු මුදල් ගෙවීම් වල එකතුව රු. 9 200 කි. 2023.09.30 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදල රු. 800 කි. 2023 අගෝස්තු මාසයේ සුළු මුදල් ගෙවීම් වල එකතුව කොපමණ ද?
    1. රු. 8 800
    2. රු. 9 200
    3. රු. 9 600
    4. රු. 10 000

28. ව්‍යාපාරයක බැංකු ගිණුමේ 2023.09.30 දිනට බැර ශේෂයක් පෙන්වීය. එය ව්‍යාපාරයට,
    1. වත්කමකි.
    2. වියදමකි.
    3. වගකීමකි.
    4. හිමිකමකි.

- **පහත සිද්ධිය භාවිතයෙන් 29 සහ 30 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

බැංකු ජංගම ගිණුමක් පවත්වාගෙන යන කුමාරියට රු. 45 000 ක් දක්වා අයිරා පහසුකමක් ලබා ගැනීමට ඇයගේ වාණිජ බැංකුව අනුමැතිය ලබා දී ඇත. ඇගේ බැංකු ගිණුමේ ශේෂය රු.18 000 ක්ව තිබීය දී අයිතිකරු වන කුමාරි නිකුත් කළ චෙක්පතකට බැංකුව රු. 30 000 ක් ගෙවා ඇති අතර එයට අමතර ව ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති බැංකු ණය මුදල රු.20 000 කි. ඒ අනුව,

29. කුමාරි ලබා ගෙන ඇති බැංකු අයිරාවේ වටිනාකම වනුයේ,
    1. රු. 30 000
    2. රු. 20 000
    3. රු. 32 000
    4. රු. 45 000

30. ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති බැංකු ණය සටහන් කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

1.	බැංකු ගිණුම	හර (රු) 20 000	2.	බැංකු ණය ගිණුම	හර (රු) 20 000
	බැංකු ණය ගිණුම	බැර (රු) 20 000		බැංකු ගිණුම	බැර (රු) 20 000
3.	බැංකු ණය ගිණුම	හර (රු) 20 000	4.	මුදල් ගිණුම	හර (රු) 20 000
	මුදල් ගිණුම	බැර (රු) 20 000		බැංකු ගිණුම	බැර (රු) 20 000

31. ව්‍යාපාරයක් ලකුණු කළ මිල රු. 160 000 වූ භාණ්ඩයක් ණයට විකිණීමේ දී රු.10 000 ක වෙළෙඳ වට්ටමක් ලබා දුන් අතර ණය බේරුම් කිරීමේ දී 10% ක මුදල් වට්ටමක් ද ලබාදුනි. ව්‍යාපාරයේ පොත් වල ගිණුම් ගත කළ යුතු මුළු වට්ටම් ප්‍රමාණය වනුයේ,
    1. රු. 26 000
    2. රු. 25 000
    3. රු. 15 000
    4. රු. 10 000

32. ඉන්වොයිසියක (ගැනුම් ඉන්වොයිසියක) සඳහන් කොන්දේසි යටතේ **"5/30/ශුද්ධ 60"** යන්නෙන් අදහස් කරන්නේ,
    1. දින 60 ක් ඇතුලත ණය බේරුම් කළ යුතු බවත් දින 30 ක් ඇතුලත ණය බේරුම් කරන්නේ නම් 5% මුදල් වට්ටමක් ලබා දෙන බවත් ය.
    2. දින 30 ඇතුලත ණය බේරුම් කළ යුතු බවත් දින 60 ක් ඇතුලත ණය බේරුම් කළ හොත් 5% ක මුදල් වට්ටමක් ලබා දෙන බවත් ය.
    3. 5% මුදල් වට්ටමක් ලබා ගැනීමට නම් දින 30 ත් 60 ත් අතර ණය බේරුම් කළ යුතු බවත් ය.
    4. ශුද්ධ විකුණුම් වලින් 60% ක් දින 30 ක් ඇතුලත බේරුම් කළ යුතු බවත් එහිදී 5% ක වට්ටමක් ලැබෙන බවත් ය.

33. ශේෂ පිරික්සුමක හර තීරුවේ ඇතුලත් කරනු ලබන ගිණුම් ඇතුලත් පිළිතුර වන්නේ,
   1. මෝටර් රථ ක්ෂය ගිණුම, මෝටර් රථ ක්ෂය වෙන් කිරීමේ ගිණුම, බැංකු අයිරාව
   2. ලී බඩු ගිණුම, ලී බඩු ක්ෂය ගිණුම, ලද වට්ටම් ගිණුම
   3. බැංකු ණය ගිණුම, බැංකු ණය පොලී ගිණුම, ගොඩනැගිලි ක්ෂය ගිණුම
   4. ගැනිලි ගිණුම, ගැනුම් ගිණුම, බැංකු අයිරා පොලී ගිණුම

34. අවිනිශ්චිත ගිණුම සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ අතරින් අසත්‍ය ප්‍රකාශය වන්නේ,
   1. වැරදි නිවැරදි කළ පසු අවිනිශ්චිත ගිණුමේ ශේෂය පියවී යයි.
   2. ශේෂ පිරික්සුමේ එකතුව වැඩි පැත්තට අවිනිශ්චිත ගිණුම යෙදේ.
   3. ශේෂ පිරික්සුමෙන් අනාවරණය වන වැරදි නිවැරදි කිරීමේ දී එක් සටහනක් අවිනිශ්චිත ගිණුමේ යෙදේ.
   4. අවිනිශ්චිත ගිණුම භාවිතා කරන්නේ ශේෂ පිරික්සුමේ හර හා බැර එකතුන් අසමාන වූ විට එය තාවකාලිකව සමාන කර ගැනීමට ය.

35. ලද පොලී ගිණුමේ ශේෂය වූ රු. 20 000 ශේෂ පිරික්සුමේ හර තීරුවේ සටහන් කිරීමේ වරද නිවැරදි කිරීමට අදාල ජ'නල් සටහන වන්නේ,

1.	අවිනිශ්චිත ගිණුම	හර	(රු)	20 000
	ලද පොලී ගිණුම	බැර	(රු)	20 000
2.	මුදල් ගිණුම	හර	(රු)	20 000
	ලද පොලී ගිණුම	බැර	(රු)	20 000
3.	ලද පොලී ගිණුම	බැර	(රු)	40 000
4.	අවිනිශ්චිත ගිණුම	හර	(රු)	40 000

- **ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා පිළිතුරු ලිවීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

2022.01.01 දින රන්තරු විසින් ආරම්භ කරන ලද ව්‍යාපාරයේ 2022.12.31 දිනට උපුටා ගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

	රු.		රු.
ගැනුම්	75 000	බැංකු ණය පොලිය	5 000
ගෙන යාමේ කුලී	2 000	බැංකු ණය	180 000
පැටවුම් ගාස්තු	5 000	ණයගැතියෝ	25 000
ගෙන ඒමේ කුලී	3 000	ණයහිමියෝ	15 000
විකුණුම්	125 000	ගැනිලි	3 000
ලද වට්ටම්	10 000	කොමිස් ගෙවීම	4 000
දුන් වට්ටම්	2 000	ඉඩම් හා ගොඩනැගිලි	400 000
විදුලි වියදම්	4 000	මෝටර් රථ	200 000
කොමිස් ආදායම	10 000	මුදල්	7 000
කඩ කුලී ගෙවීම්	5 000	ප්‍රාග්ධනය 2022.01.01	400 000

♦ මීට අමතරව ව්‍යාපාරයේ 2022.12.31 දිනට ඉතිරි බඩු තොගයේ අගය රු. 15 000 කි.

- **ඉහත තොරතුරු භාවිතා කොට ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

36. රන්තරු ව්‍යාපාරයේ විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩ වල පිරිවැය වන්නේ,
   1. රු. 82 000 2. රු. 85 000 3. රු. 83 000 4. රු. 98 000

37. ව්‍යාපාරයේ විකුණුම් පිරිවැය සහ දළ ලාභය පිළිවෙලින් දක්වා ඇති පිළිතුර වනුයේ,
   1. රු. 67 000 සහ රු. 58 000
   2. රු. 68 000 සහ රු. 57 000
   3. රු. 83 000 සහ රු. 42 000
   4. රු. 82 000 සහ රු. 43 000

38. ව්‍යාපාරයේ පරිපාලන වියදම් සහ වෙනත් ආදායම් පිළිවෙලින් දක්වා ඇති පිළිතුර වනුයේ,
   1. රු. 9 000 සහ රු. 20 000
   2. රු. 9 000 සහ රු. 10 000
   3. රු. 4 000 සහ රු. 10 000
   4. රු. 4 000 සහ රු. 20 000

39. ව්‍යාපාරයේ 2022.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභය වන්නේ,
   1. රු. 45 000 2. රු. 55 000 3. රු. 67 000 4. රු. 65 000

40. 2022.12.31 දිනට ව්‍යාපාරයේ අයිතිකරුගේ හිමිකම වන්නේ,
   1. රු. 442 000 2. රු. 455 000 3. රු. 452 000 4. රු. 400 000

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය මතුගම අධ්‍යාපන කලාපය මතුගම අධ්‍යාපන කලාපය මතුගම අධ්‍යාපන කලාපය මතුගම අධ්‍යාපන කලාපය

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2023

11 ශ්‍රේණිය | **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය** | **පත්‍රය II**

සැලකිය යුතුයි :-

- ✷ **පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද, II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- ✷ **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථා වලදී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.**

01. ව්‍යවසායකත්ව කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධියක් හිමි රසික කොන්ක්‍රීට් නිෂ්පාදිත අලෙවි කිරීම සඳහා ''රසික කොන්ක්‍රීට් ට්‍රේඩර්ස්'' (Rasika Concrete Traders) නමින් ව්‍යාපාරයක් **2023.09.01** දින ආරම්භ කරන ලදී. විකිණීම සඳහා අවශ්‍ය කොන්ක්‍රීට් නිෂ්පාදිත ''සි/ස. නිල්වලා කොන්ක්‍රීට් නිෂ්පාදන (පුද්.) සමාගමින් පමණක් රසික අත්පිට මුදලට හා ණයට මිලට ගනී. විකිණීම සඳහා ලබා ගන්නා කොන්ක්‍රීට් නිෂ්පාදිත වලට ප්‍රධාන වශයෙන් මල්පෝච්චි හා කොන්ක්‍රීට් කණු ඇතුලත් වේ.

මෙම ව්‍යාපාරය ඇරඹීම සඳහා රසික මුදලින් **රු. 1 000 000** ක් ද **රු. 800 000** වටිනා තමාගේ පෞද්ගලික ලොරි රථය ද ව්‍යාපාරයට යෙදවූ අතර කුඩා ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් යටතේ **2023.09.16** වන දින **10%** පොලියට **රු. 600 000** ක බැංකු ණයක් ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලදී.

2023 සැප්තැම්බර් මස පළමුවන දින කොන්ක්‍රීට් වැඩ පිළිබඳ හසල දැනුමක් ඇති තමාගේ මිතුරෙකු වූ නිමල් ද **රු. 45 000** ක මාසික වැටුපකට ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී.

2023 සැප්තැම්බර් මාසය තුල මුදලින් සහ ණයට සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

		රු.
9/1	භාණ්ඩ මිලට ගැණුම්	800 000
9/1	භාණ්ඩ අත්පිට විකුණුම්	750 000
9/3	භාණ්ඩ ණය විකුණුම්	500 000
9/8	භාණ්ඩ ණයට ගැණුම්	500 000
9/15	ලොරි රථ අළුත්වැඩියා වියදම්	12 500
9/18	ඉන්ධන සඳහා වියදම්	15 000
9/22	අත්පිට විකුණුම්	600 000
9/25	සේවක වැටුප්	45 000
9/28	ණයට ගත් භාණ්ඩ සඳහා මුදල් ගෙවීම	28 500
	ලද වට්ටම්	15 000
9/29	අයිතිකරුගේ මුදල් ගැනිලි	25 000

- ව්‍යාපාරයේ සැප්තැම්බර් මාසයට අදාල විදුලි බිල වූ **රු. 5 000** ක බිල 9/30 දින ලැබුණු අතර ඒ සඳහා මුදල් ගෙවා නොමැත.
- ලොරි රථය වාර්ෂිකව **12%** බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.
- එමෙන්ම ව්‍යාපාරය පුළුල් කිරීමේ අදහසින් කොන්ක්‍රීට් නිෂ්පාදිත, නිෂ්පාදනය කිරීමට තීරණය කර ඇති අතර ඒ සඳහා යන්ත්‍ර දෙකක් සහ සේවකයන් දෙදෙනෙකු බඳවා ගැනීමට ද රසික තීරණය කර ඇත.
- 2023 සැප්තැම්බර් මාසය අවසානයේ (9/30) ඉතිරි භාණ්ඩ තොගය **රු. 50 000** ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(i) (අ) ''රසික කොන්ක්‍රීට් ට්‍රේඩර්ස්'' අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය ලියා දක්වන්න.

(ආ) ඉහත සිද්ධියට අනුව නෛතික පුද්ගලභාවය සහිත ව්‍යාපාර සංවිධානයක් ලියා දක්වන්න.

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

(ii) (අ) අලෙවිකරන මිශ්‍රයේ නිෂ්පාදිතය යන්නට අයත් වන දෑ දෙකක් සිද්ධිය ඇසුරින් ලියා දක්වන්න.
(ආ) ''රසිකගේ ව්‍යාපාර ආයතනය ලියාපදිංචි කළ යුතුයි.'' යන ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ දැයි දක්වා එකඟ වන්නේ නම් හෝ නොවන්නේ නම් එයට හේතුව ලියා දක්වන්න.

(iii) (අ) රසිකගේ ව්‍යාපාරයේ ශක්තියක් නම් කරන්න.
(ආ) කළමනාකරණ ක්‍රියාවලියේ සැලසුම්කරණය යන කාර්යයට අයත් කරුණු දෙකක් සිද්ධිය ඇසුරින් ලියා දක්වන්න.

(iv) (අ) මෙම සිද්ධියේ සඳහන් රාජ්‍ය ආයතනයක් නම් කරන්න.
(ආ) රසිකට තම ව්‍යාපාරය නෛතික පුද්ගලභාවය සහිත ව්‍යාපාරයක් බවට පත් කළ යුතු නම්, ඔහුට එසේ කිරීම සඳහා අදාල වන පනත ලියා දක්වන්න.

(v) මෙම සිද්ධියට අනුව 2023.09.01 දිනට ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය ලියා දක්වන්න.

(vi) 2023.09.16 වන දින සිදු වූ ගනුදෙනුව සඳහා ද්විත්ව සටහන වටිනාකම් සහිතව ලියා දක්වන්න.

(vii) (අ) 2023 සැප්තැම්බර් මාසයට අදාල ලොරිරථ (මෝටර් රථ) ක්ෂය ප්‍රමාණය කොපමණ ද?
(ආ) එය ගිණුම්ගත කිරීමට අදාල ජනල් සටහන ලියා දක්වන්න.

(viii) (අ) රසිකගේ ව්‍යාපාරය භාවිතා කරන මූලික සටහන් පොත් දෙකක් ලියා දක්වන්න.
(ආ) රසිකගේ ව්‍යාපාරයේ 2023.09.30 දිනට වෙළෙඳ ණය හිමියන්ගේ වටිනාකම කොපමණ ද?

(ix) රසිකගේ ව්‍යාපාරයේ 2023.09.30 දිනට (අත ඉතිරි මුදල) මුදල් ශේෂය ගණනය කරන්න.

(x) රසිකගේ ව්‍යාපාරයේ 2023.09.30 දිනට ශුද්ධ ලාභය ගණනය කරන්න.

(එක් කොටසකට ලකුණු 2 බැගින් 10 x 2 = 20)

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය
(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

02. (i) (අ) ව්‍යාපාරයක් යනු කුමක් ද?
(ආ) ව්‍යාපාරයකට ඇති පොදු ව්‍යාපාර අරමුණු ඉටු කර ගැනීමට ඇති විවිධ ඉලක්ක නැතහොත් උප අරමුණු (උප ව්‍යාපාර අරමුණු) දෙකක් ලියා දක්වන්න.

(ii) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න ලියා දක්වන්න.
(අ) නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගන්නා ගොඩනැගිලි නිෂ්පාදන සාධකයක් වන භූමියට අයත් වේ.
(ආ) අධ්‍යාපනය යන අවශ්‍යතාවය සපුරාලනු ලබන ආයතනයක් වන්නේ රියදුරු පුහුණු පාසලයි.
(ඉ) සිල්ලර හා තොග වෙළෙඳ සැල් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර වේ.
(ඊ) ව්‍යාපාර කාර්යය ඉටු කරන පුද්ගලයන් එහි අයිතිකරුවෝ වෙති.

(iii) ඥානවතී විසින් ප්‍රධාන රෝහලක ආපන ශාලාවක් ඉතාමත් සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද භාවිතා කරමින් පවත්වාගෙන යයි. එම ආපන ශාලාවේ ඇති කෑම වර්ග සඳහා රෝගීන්, රෝගීන් බැලීමට එන ජනතාව, වෛද්‍යවරුන් ඇතුළු රෝහල් කාර්යය මණ්ඩලය වැඩි කැමැත්තක් දක්වයි.
(අ) රෝහල් ආපන ශාලාව කෙරෙහි උනන්දුවක් දක්වන මෙම සිද්ධියේ සඳහන් පාර්ශව දෙකක් ලියා දක්වන්න.
(ආ) ඉහත ''අ'' යටතේ ඔබ සඳහන් කළ එක් එක් පාර්ශවයන් ආපන ශාලාව කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතුව බැගින් ලියන්න.

(iv) මෝස්තර නිර්මාණය පිළිබඳ උපාධිධාරියෙක් වන මහේෂ් යුරෝපයට ඇඟළුම් අපනයනය කිරීමේ නිරත ව්‍යාපාරිකයෙකි වර්තමානයේ පවතින රුසියානු - යුක්‍රේන යුද්ධය නිසා යුරෝපීය රටවල උද්ධමනය වැඩි වී, ඇඟළුම් සඳහා වන ඉල්ලුම පහත වැටී ඇත. එම නිසා ඔහු ඇමෙරිකා එක්සත් ජනපදයේ වෙළෙඳ පොළ සොයාගෙන එරටට ඇඟළුම් අපනයනය කිරීම ආරම්භ කර ඇත. ඒ තුලින් ඔහු, ඔහුගේ පහත වැටුණු අපනයන ආදායම උපයමින් සිටී.

මෙම සිද්ධියට අනුව, මහේෂ්ගේ ව්‍යාපාරයට ඇති

(අ) ශක්තියක්

(ආ) තර්ජනයක් ලියා දක්වන්න.

(එක් කොටසකට ලකුණු 2 බැගින් 4 x 2 = 08)

03. (i) සන්නිවේදන මූලිකාංග ඇතුලත් ක්‍රියාවලිය රූප සටහනක ඇඳ දක්වන්න.

(ii) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න ලියා දක්වන්න.

(අ) ජීවිත රක්ෂණය සඳහා හානි පූරණය මූලධර්මය බලපායි.

(ආ) වාණිජ බැංකුවක් වෙනත් බැංකුවකින් වෙනස් වන්නේ ජංගම ගිණුම් පවත්වාගෙන යාම මතය.

(ඉ) නැවත විකිණීමේ අරමුණින් නිෂ්පාදිත මිලට ගැනීම තොග වෙළෙඳාමකි.

(ඊ) ශ්‍රී ලංකාවේ නාවුක ප්‍රවාහනය (ජලමාර්ග ප්‍රවාහනය) සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනය වන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යි.

(iii) A,B,C සහ D අක්ෂර වලින් දැක්වෙන අංක මොනවාද යන්න පහත චෙක් පතේ දක්වා ඇති (චෙක්පතක කාන්දම් තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවේ - MICR) අක්ෂර පිළිවෙලට ලියා දක්වන්න.



(iv) කසුන් තම පෞද්ගලික මෝටර් රථයෙන් ගමන් කරමින් සිටියදී මෝටර් රථය යතුරු පැදියක ගැටීමෙන් මෝටර් රථයට හා යතුරු පැදියට හානි සිදුවිය. කසුන් එය තම ජංගම දුරකථනයෙන් ඇමතුමක් ගෙන මෝටර් රථය රක්ෂණය කර තිබූ ශ්‍රී ලංකා රක්ෂණ සමාගමට දැන් විය. ඒ අනුව,

(අ) රක්ෂණයට සම්බන්ධ වන පාර්ශව ඉහත සිද්ධියට අනුව පිළිවෙලින් උදාහරණ සහිතව ලියා දක්වන්න.

(ආ) කසුන් තම ජංගම දුරකථනයෙන් ලබා ගත් ඇමතුම අයත් වන සන්නිවේදන මාධ්‍ය/මාධ්‍යන් ලියා දක්වන්න.

(එක් කොටසකට ලකුණු 2 බැගින් 4 x 2 = 08)

04. (i) අලෙවිකරණ මිශ්‍රයේ ඇති විචල්‍යයන් අතුරින් ව්‍යාපාරිකයෙකුට / ව්‍යාපාරයකට වියදම් ගෙන දෙන විචල්‍යයන් ලියා දක්වන්න.

(ii) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න ලියා දක්වන්න.

(අ) ව්‍යාපාර අරමුණු අපේක්ෂිත අයුරින් ඉටු කර ගැනීම කාර්යක්ෂමතාව යි.

(ආ) මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වටිනාකමින් යුත් නිෂ්පාදිතයක් නිර්මාණය කිරීමේ හා පිළිගැන්වීමේ ක්‍රියාවලිය අලෙවිකරණය යි.

(ඉ) පාරිභෝගිකයෙකු නිෂ්පාදිතයක් මිලට ගැනීමේ දී සලකා බලන ප්‍රධානතම සාධකය වන්නේ මිලයි.

(ඊ) අවම සම්පත් ප්‍රමාණයකින් උපරිම ප්‍රයෝජන ලැබෙන පරිදි සම්පත් භාවිත කිරීම සඵලදායකත්වය යි.

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

(iii) විද්‍යාලීය වාණිජ දින උත්සවයක් යටතේ පහත ක්‍රියාවන් සඳහා අදාල වන කළමනාකරණ කාර්යයන් නම් කරන්න.

(අ) වාණිජ දිනය සඳහා තේමාව, පවත්වන දිනය, වේලාව හා ස්ථානය තීරණය කිරීම.

(ආ) වාණිජ දිනයේ කාර්යය අනුව කමිටු පත් කිරීම.

(ඉ) ඒ ඒ කමිටු නිසි අයුරින් ක්‍රියාත්මක වේ දැයි සොයා බැලීම.

(ඊ) කමිටු නායකයන් විසින් තම සාමාජිකයන් ඒ ඒ කාර්යය වල යෙදවීම.

(iv) යෝගට් නිෂ්පාදන ආයතනයක් තම යෝගට් අලෙවිය වැඩි කර ගැනීම සඳහා රු.70 ක් වන යෝගට් එකක් මිලට ගන්නේ නම් එකක මිල රු.5 කින් අඩු කිරීමත් යෝගට් 10 ක් මිලදී ගන්නේ නම් යෝගට් 5 ක් නොමිලේ දීමනාවක් ලෙස ලබාදීමත් සිදු කරයි. ඉහත ක්‍රියාවන් දෙක අලෙවි මිශ්‍රයේ කුමන විචල්‍යකට අයත් වේ ද?

(එක් කොටසකට ලකුණු 2 බැගින් 4 x 2 = 08)

II කොටස - ගිණුම්කරණය
(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

05. (i) වියදම් යන්න හඳුන්වන්න. (ලකුණු 02)

(ii) පහත දැක්වෙන ගණුදෙනු දෙක සඳහා ද්විත්ව සටහන් ලියා දක්වන්න.

(අ) අයිතකරුගේ භාණ්ඩ ගැනිලි රු. 5000

(ආ) බැංකු ණය වාරිකය පියවීම සඳහා මුදල් ගෙවීම රු. 25 000

(ලකුණු 02)

(iii) ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක බලපෑම ගිණුම්කරණ සමීකරණ අනුසාරයෙන් පහත පරිදි දක්වා ඇත.

දිනය	වත්කම්	=	හිමිකම	+	වගකීම
ඔක්. 1	වැඩි වීම අඩු වීම	=			
ඔක්. 2	වැඩි වීම	=			වැඩි වීම
ඔක්. 3	වැඩි වීම	=	වැඩි වීම		
ඔක්. 4	අඩු වීම	=	අඩු වීම		අඩු වීම
ඔක්. 5		=	වැඩි වීම		අඩු වීම

ඉහත ගිණුම්කරණ සමීකරණය අනුසාරයෙන්, ඔක්. 02 සහ ඔක්. 03 යන දින සඳහා සිදු වූයේ යැයි අනුමාන කළ හැකි ගණුදෙනු **දෙක බැගිනුත්** ඔක්. 04 සහ ඔක්. 05 සඳහා සිදු වූයේ යැයි අනුමාන කළ හැකි ගනුදෙනු **එක බැගිනුත්** ලියා දක්වන්න.

♦ **පිළිතුරු ලිවීම සඳහා පහත ක්‍රමය අනුගමනය කරන්න.**

උදාඃ- <u>ඔක්තෝම්බර් 01</u>

(i) ණයගැතියන්ගෙන් මුදල් ලැබීම රු. 50 000

(ii) රු. 50 000 ක් වටිනා ලී බඩු මිලට ගැනීම (ලකුණු 04)

(iv) පහත ගනුදෙනුව පොදු ජ'නලයක සටහන් කොට ලෙජර ගිණුම් වලට පිටපත් කරන්න.

2023.10.01 කුමාරගේ ව්‍යාපාරය රු. 200 000 ක් වටිනා ලී බඩු දම්රෝ සමාගමෙන් ණයට ගැනීම. (ජ'නල් වවුචර් අංක 01) (ලකුණු 04)

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

06. (i) පෙරේරාගේ ව්‍යාපාරයේ 2023 සැප්තැම්බර් මාසයේ සිදු වූ සුළු වියදම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

දිනය	විස්තරය	මුදල (රු.)
2023.09.01	අග්‍රිමය ප්‍රතිපූර්ණය කළා	2 500
2023.09.04	ගමන් වියදම්	320
2023.09.06	ලිපි ද්‍රව්‍ය වියදම්	260
2023.09.09	ගෙන ඒමේ කුලී	400
2023.09.12	සංග්‍රාහ වියදම්	300
2023.09.14	ත්‍රිරෝද රථ ගාස්තු	200
2023.09.18	කුඩා ගණක යන්ත්‍රයක් (Calculater) ගැනීම	600
2023.09.20	කාබන් කොළ මිලට ගත්තා	200
2023.09.22	සංග්‍රාහ වියදම්	150
2023.09.24	පරිත්‍යාග කිරීම	200
2023.09.28	පෑන්, පැන්සල් මිලට ගැනීම	150

ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 3 000 ක් වන අතර 2023 සැප්තැම්බර් මස 01 දින ප්‍රතිපූර්ණය කර ඇති අතර 2023 ඔක්තොම්බර් මස 01 දින ද අග්‍රිමය ප්‍රතිපූරණය කළ යුතුය.

අවශ්‍ය වන්නේ :- ගමන් වියදම්, ලිපිද්‍රව්‍ය වියදම්, සංග්‍රහ වියදම්, විවිධ වියදම් යන විශ්ලේෂණ තීරු සහිතව 2023 සැප්තැම්බර් මාසය සඳහා සුළු මුදල් පොත පිළියෙළ කිරීම සහ අවශ්‍ය ලෙජර ගිණුම් පිළියෙළ කිරීම. (ලකුණු 04)

(ii) • 2023 සැප්තැම්බර් මස 30 වන දිනට සමන්ගේ බැංකු ගිණුමේ ශේෂය රු. 50 000 ක් විය. එහෙත් එදිනට බැංකු ප්‍රකාශනයේ සඳහන් වටිනාකම එම ශේෂයට වඩා වෙනස් විය. වෙනසට හේතු ලෙස පහත කරුණු සොයා ගන්නා ලදී.

- තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත රු. 10 000
- බැංකුව අය කරගෙන තිබූ චෙක්පොත් ගාස්තු රු. 500 ක් සහ බැංකු ගාස්තු රු. 1000
- බැංකුව විසින් කළ ස්ථාවර නියෝග මත ගෙවීම් රු. 5 000
- ණයගැතියන් විසින් ඍජුවම බැංකුවට කර තිබූ ණයගැති ප්‍රේෂණ රු. 8 000
- නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත රු. 7 000

අවශය වන්නේ,

(අ) බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.

(ආ) 2023.09.30 දිනෙන් අවසන් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය (විස්තරය) පිළියෙළ කිරීම.

(ලකුණු 04)

(iii) කසුන්ගේ ව්‍යාපාරයේ 2023.09.30 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ එකතුව සමාන නොවූ හෙයින් එහි වෙනස වූ රු. 2 700 අවිනිශ්චිත ගිණුමට හර කරන ලදී. පසුව කළ විගණනයේ දී පහත වැරදි අනාවරණය විය.

- රු. 8 500 ක දුරකථන වියදම් ගෙවීම දුරකථන වියදම් ගිණුමේ සටහන් වී ඇත්තේ රු. 5 800 ක් ලෙසය.
- රු. 4 000 ක විදුලි වියදම් ගෙවීම ගිණුම් පොත් වලින් සම්පූර්ණයෙන් ම මගහැරී ඇත.
- රු. 6 000 ක ගැණුම් ඉන්වොයිසියක් ගිණුම් පොත් වල දෙවරක් සටහන් වී ඇත.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජ්නල් සටහන් ලියා දැක්වීම.

(ආ) අවිනිශ්චිත ගිණුම පිළියෙළ කිරීම. (ලකුණු 04)

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

07. (i) (අ) වෙළඳ ගිණුම පිළියෙළ කිරීමේ අරමුණ කුමක් ද?
(අ) ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කිරීමේ ද්විත්ව සටහන ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) පහත තොරතුරු භාවිත කොට සඳුන්ගේ ව්‍යාපාරයේ, 2023.09.30 දිනට හිමිකම ගණනය කරන්න.

2023.09.01 දිනට ප්‍රාග්ධනය රු. 300 000
සැප්තැම්බර් මාසය තුළ, සඳුන්ගේ මුදල් ගැනිලි රු. 10 000
භාණ්ඩ ගැනිලි රු. 5 000
සැප්තැම්බර් මාසයේ ආදායම රු. 150 000
සැප්තැම්බර් මාසයේ වියදම රු. 60 000
සැප්තැම්බර් 25 වන දින අයිතිකරු වන සඳුන් ව්‍යාපාරයට යෙදූ මුදල රු. 50 000 (ලකුණු 02)

(iii) රාජා විසින් 2022.01.01 දින ආරම්භ කළ ව්‍යාපාරයේ, 2022.12.31 වන දිනට උපුටාගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

රාජාගේ ව්‍යාපාරය
2022.12.31 දිනට ශේෂ පිරික්සුම

	හර (රු.)	බැර (රු.)
ගැණුම්	550 000	-
විකුණුම්	-	700 000
ගොඩනැගිලි - (පිරිවැයට)	400 000	-
කාර්යාල උපකරණ (පිරිවැයට)	100 000	-
ගෙන ඒමේ කුලී	10 000	-
පැටවුම් කුලී	2 000	-
දුන් වට්ටම් හා ලද වට්ටම්	2 000	6 000
රක්ෂණය	6 000	-
ප්‍රචාරණය වියදම්	3 000	-
බොල් ණය	2 000	-
විදුලි වියදම්	5 000	-
බැංකු ණය 15%	-	100 000
බැංකු ණය පොළී	8 000	-
ණයගැතියෝ සහ ණයහිමියෝ	25 000	30 000
බැංකු ශේෂය	-	10 000
මුදල්	33 000	-
2022.01.01 දිනට ප්‍රාග්ධනය		300 000
	1 146 000	1 146 000

අමතර තොරතුරු පහත දැක්වේ.
- 2022.12.31 දිනට ඉතිරි බඩු තොගය රු. 20 000
- ණයගැතියන්ගෙන් තවත් රු. 3 000 ක් බොල් ණය ලෙස කපා හැරිය යුතුය.
- ගොඩනැගිලි සහ කාර්යාල උපකරණ පිරිවැය මත වාර්ෂිකව 10% බැගින් ක්ෂය කළ යුතුය.

අවශ්‍ය වන්නේ,
(අ) 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04)
(ආ) 2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ලකුණු 04)

❋❋❋

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2023 (නොවැම්බර්)

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (60)

Bussiness & Accounting Studies

11 - ශ්‍රේණිය

I පත්‍රය - පිළිතුරු

ප්‍රශ්ණ අංකය	පිළිතුරෙහි අංකය	ප්‍රශ්ණ අංකය	පිළිතුරෙහි අංකය	ප්‍රශ්ණ අංකය	පිළිතුරෙහි අංකය	ප්‍රශ්ණ අංකය	පිළිතුරෙහි අංකය
01	3	**11**	2	**21**	3	**31**	3
02	1	**12**	4	**22**	4	**32**	1
03	2	**13**	2	**23**	3	**33**	4
04	2	**14**	2	**24**	1	**34**	2
05	3	**15**	2	**25**	2	**35**	4
06	3	**16**	2	**26**	2	**36**	3
07	3	**17**	3	**27**	3	**37**	2
08	4	**18**	4	**28**	3	**38**	1
09	3	**19**	2	**29**	3	**39**	2
10	2	**20**	4	**30**	2	**40**	3

විශේෂ උපදෙස් :- එක් පිළිතුරකට ලකුණු **01** බැගින්

මුළු ලකුණු 01 x 40 = 40

II පත්‍රය - පිළිතුරු

01.

(i) අ - තනි පුද්ගල ව්‍යාපාර /කේවල ස්වාමි ව්‍යාපාර
ඒක පුද්ගල ව්‍යාපාර / පෞද්ගලික අංශයේ ව්‍යාපාර

(ල. 01)

ආ - සී/ස නිල්වලා කොන්ක්‍රීට් නිෂ්පාදන (පුද්) සමාගම / සංස්ථාපිත සමාගම්
ලංකා බැංකුව (රාජ්‍ය සංස්ථාවකි - විශේෂ පණතක් යටතේ පිහිටවූ)

(ii) අ - මල් පෝච්චි
කොන්ක්‍රීට් කණු (ල. 01)

මතුගම අධ්‍යාපන කලාපය

ආ - එකඟ වෙමි / ඔව්

රසිකගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වා ගෙන යන නිසා “රසික කොන්ක්‍රීට් ට්‍රේඩර්ස්” ආයතනය ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියා පදිංචි කළ යුතුය

(ල. 01)

(iii) අ -
- රසික ව්‍යවසායකත්ව කළමණාකරණය පිළිබඳ උපාධිධාරියකු වීම
- හොඳ මූල්‍ය ශක්තියක් පැවතීම (ප්‍රාග්ධනය යහපත් වීම)
- සේවකයාගේ (නිමල්ගේ) කොන්ක්‍රීට් වැඩ පිළිබඳව හසල දැනුම

(ල. 01)

ආ -
- යන්ත්‍ර දෙකක් මිලට ගැනීමට තීරණය කිරීම
- සේවකයන් දෙදෙනකු බඳවා ගැනීමට තීරණය කිරීම
- කොන්ක්‍රීට් නිෂ්පාදිත නිෂ්පාදනය කිරීමට තීරණය කිරීම (ව්‍යාපාරය පුළුල් කිරීමේ අදහසින්)

(ල. ½ x 2 = 01)

(iv) අ - ලංකා බැංකුව

(ල. 01)

ආ - 2007 අංක 07 දරන සමාගම් පනණ

(ල. 01)

(v)

වත්කම්		=	හිමිකම්	+	වගකීම්
A		=	C	+	L
+1,000,000	මුදල්	=	+1,800,000	+	-
+ 800,000	මෝටර් රථය				
1,800,000			1,800,000	+	0

හෝ

වත්කම්	=	හිමිකම්
A	=	C
1,800,000	=	1,800,000

(ල. 02)

(vi) මුදල් ගිණුම (හර) 600,000

බැංකු ණය ගිණුම (බැර) 600,000
(ලංකා බැංකුව)

ලංකා බැංකුව කියා තිබුනත් ලකුණු (ල. 02)

(vii) අ - රු 8000 ($800000 \times \frac{12}{100} \times \frac{1}{12}$)

(ල. 01)

මතුගම අධ්‍යාපන කලාපය

ආ

පොදු ජනලය

දිනය	ස පි	විස්තරය	ලෙ පි	හර (රු)	බැර (රු)
2023/9/30	01	මෝටර් රථ ක්ෂය ගිණුම (හර) මෝටර් රථ ක්ෂය වෙන් කි. ගි. (සැප්තැම්බර් මාසයට අදාල මෝටර් රථ ක්ෂය ගිණුම් ගත කිරීම)		8000	 8000

(සංලක්ෂය අනිවාර්යයෙන් තිබිය යුතුය)

(ල. 01)

(viii) අ
* මුදල් පොත
* පොදු ජනලය
* ගැනුම් ජනලය
* විකුණුම් ජනලය

(ල. 01)

ආ ණයට ගැනුම් ⟶ 9/2 රු 500000
(-) ණයහිමියන්ට ගෙවීම් රු 285000
ලද වට්ටම් රු 15000 (300000)
9/30 දිනට ණයහිමි ශේෂය 200000

හෝ

ණයහිමි ගිණුම

9/28	මුදල් ගිණුම	285000	9/8	ගැනුම් ගිණුම	500000
	වට්ටම	15000			
	ශේෂය/ප/ගෙ	200000			
		500000			500000
			9/30	ශේෂය/ඉ/ගෙ	200000

23/9/30 දිනට වෙළඳ ණයහිමියෝ = රු. 200000

(ල. 01)

(ix)

මුදල් ගිණුම

දිනය	විස්තරය	ස පි	වටිනාකම	දිනය	විස්තරය	ස පි	වටිනාකම
23/9/1	ප්‍රාග්ධනය			23/9/2	ගැනුම්		800000
9/2	විකුණුම්		1,000,000	9/15	ලොරි අළුත්වැඩියා වි.		12500
9/16	බැංකු ණය		750,000	9/18	ඉන්ධන වියදම්		15000
9/22	විකුණුම්		600,000	9/25	සේවක වැටුප්		45000
			600,000	9/28	ණයහිමි ගිණුම		285000
				9/29	ගැනිලි		25000
				9/30	ශේෂය/ප/ගෙ		1767500
			2,950,000				2,950,000
9/30	ශේෂය/ඉ/ගෙ		1,767,500				

අයිතම 3 ක් සඳහා ල ½

මෙම අයිතම 6 න් 4 වත් තිබේ නම් (ල ½)

* 2023/1/31 දිනට මුදල් ශේෂය රු **1,767,500** (ල. 02)

(ලැබීම් හා ගෙවීම් ආකෘතියටද මෙය ගණනය කළ හැක මුදල් ගිණුම අනිවාර්යය නොවේ)

(x) රසිකගේ ව්‍යාපාරයේ 2023/9/30 දිනට ශුද්ධ ලාභය ගණනය කිරීම

		රු	
විකුණුම් (අත්පිට + ණයට)		1,850,000	ල ¼
(-) අඩු කළා <u>විකුණුම් පිරිවැය</u>			
ගැනුම් (අත්පිට + ණයට)	1300000		
(-) 9/30 ඉතිරි තොගය	(50000)		
විකුණුම් පිරිවැය		(1,250,000)	ල ¼
දළ ලාභය		600,000	
+ <u>අමතර ආදායම</u>			
ලද වට්ටම්		15000	ල ¼
		615,000	
(-) වියදම්			
බැංකු ණය පොලී $(600000 \times \frac{10}{100} \times \frac{1}{12}) \times \frac{1}{2}$	2500		
විදුලි වියදම්	5000		ල ¼
මෝටර් රථ ක්ෂය	8000		
ලොරි අළුත්වැඩියා වියදම්	12500		
ඉන්ධන වියදම්	15000		
සේවක වැටුප්	45000	(88000)	ල ¼
ශුද්ධ ලාභය		527,000	

2023/09/30 දිනට ශුද්ධ ලාභය = රු 527000

(ල. 02)

(මෙම ආදායම් වලින් වියදම අඩුකර වුවද ගණනය කළ හැක. ආකෘතියක් නොමැත. ළමයා කර ඇති ආකාරය අනුව ලකුණු දෙන්න)

{ මුළු ලකුණු 2 x 10 = 20 }

මහගම අධ්‍යාපන කලාපය

I කොටස – (ව්‍යාපාර අධ්‍යනය)

(02.)

(i) අ – ව්‍යාපාරයක් යනු මිනිස් අවශ්‍යතා සපුරා ලීමට අවශ්‍ය විවිධ වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි

(ල. 01)

ආ -
* භාණ්ඩ හා සේවා වල ගුණාත්වය ඉහළ නැංවීම
* රැකියා උත්පාදනය
* සේවක සුභසාධනය

(ල. ½ x 2 = 01)

(ii)
අ - අසත්‍යයි
ආ - සත්‍යයි
ඉ - අසත්‍යයි
ඊ - අසත්‍යයි

{ ✔ හෝ **X** ලකුණු යොදා තිබුනහොත් ලකුණු දෙන්න එපා }

(ල. ½ x 4 = 02)

(iii) අ

- අයිතිකරු → ඥානවතී
- ගනුදෙනුකරුවන් → රෝගීන් රෝගීන් බැලීමට එන ජනතාව, රෝහල් කාර්ය මණ්ඩලය, වෛද්‍යවරුන්
- සැපයුම්කරුවන් → ආපන ශාලවට ආහාර සපයන අය

(අයිතිකරු / ගණුදෙනුකරුවන් / සැපයුම්කරුවන් යන වචන අනිවාර්ය වේ. උදාහරණ නැතත් කමක් නැත)

(ල. ½ x 2 = 01)

ආ

ඇල්මැති	උනන්දුවක් දැක්වීමට හේතු
අයිතිකරුවන්	• ආයෝජනයේ සුරක්ෂිතභාව • ප්‍රමාණවත් ලාභයක් ලැබීමට • ව්‍යාපාරයේ අනාගත වර්ධනය
ගනුදෙනුකරුවන	• නිෂ්පාදිත සාධාරන මිලකට ලබාගැනීම • ගුණාත්මක නිෂ්පාදිත ලබාගැනීම
සැපයුම්කරුවන්	• අඛණ්ඩව ඇනවුම් ලබාගැනීම • නිසිපරිදි මුදල් ලබා ගැනීමට

(ල. ½ x 2 = 01)

මහගම අධ්‍යාපන කලාපය

(iv)

අ - * මෝස්තර නිර්මාණය පිළිබඳව උපාධිධාරියෙක් වීම
* මහේෂ්ගේ ව්‍යාපාරික ඥානය / දක්ෂතාවහය

(ල. ½ x 2 = 01)

ආ - යුක්‍රේන - රුසියානු යුද්ධය නිසා

* යුරෝපීය රටවල උද්ධමනය ඉහළ යාම
* ඇගළුම් සඳහා වන ඉල්ලුම අඩු වීම

(ල. ½ x 2 = 01)

{ මුළු ලකුණු 02 x 4 = 8 }

(03.)

(i) යවන්නා → පණිවිඩය → මාධ්‍ය → ලබන්නා → ප්‍රතිචාරය → ප්‍රතිපෝෂණය → යවන්නා

(ල. 02)

(ii) අ - අසත්‍යයි
ආ - සත්‍යයි
ඉ - සත්‍යයි
ඊ - සත්‍යයි

{ ✓ හෝ **X** ලකුණු යොදා තිබුනහොත් ලකුණු දෙන්න එපා }

(ල. ½ x 4 = 02)

(iii)

A. චෙක්පත් අංකය
B. බැංකු අංකය
C. බැංකු ශාඛා අංකය / ශාඛා අංකය
D. ගිණුම් අංකය ජංගම / ගිණුම් අංකය

(ල. ½ x 4 = 02)

(iv) අ -
- පළමු පාර්ශවය (පක්ෂය) → උදා :- කසුන්
- දෙවන පාර්ශවය (පක්ෂය) → උදා :- ශ්‍රී ලංකා රක්ෂණ සමාගම
- තෙවන පාර්ශවය (පක්ෂය) → උදා :- යතුරු පැදිය

(ල. 01)

ආ - විද්‍යුත් / වාචික හෝ විද්‍යුත්, වාචික

(මේ ආකාරයටම තිබිය යුතුය)

(ල. 01 x 2 = 02)

{ මුළු ලකුණු 02 x 4 = 8 }

මතුගම අධ්‍යාපන කලාපය

(04.)

(i)
- නිෂ්පාදිතය
- ස්ථානය
- ප්‍රවර්ධනය

(ල. 02)

(ii)
අ - අසත්‍යයි
ආ - සත්‍යයි
ඉ - සත්‍යයි
ඊ - අසත්‍යයි

{ ✓ හෝ **X** ලකුණු යොදා තිබුනහොත් ලකුණු දෙන්න එපා }

(ල. ½ x 4 = 02)

(iii)
අ - සැලසුම්කරණය
ආ - සංවිධානකරණය
ඉ - පාලනය
ඊ - මෙහෙයවීම

} මෙම වචන මෙම ආකාරයෙන්ම පැවතිය යුතු වේ

(iv) “මිල” නැමැති විචල්‍යට අයත් වේ (ල. 02)

(නමුත් ඉදිරියේ දී <u>දීමනා</u> යන්න ප්‍රවර්ධනය යටතේ ද උගන්වන්න පසුගිය වැඩ සටහනක දී අධ්‍යාපන අමාත්‍යංශයෙන් දැනුම් දෙන ලද පණිවුඩයකි)

(ල. ½ x 4 = 02)

{ මුළු ලකුණු 02 x 4 = 8 }

<u>II කොටස – (ගිණුම්කරණය)</u>

(05.)

(i) ගැනිලි නිසා සිදුවන හිමිකමෙහි අඩුවීම හැරුණු විට හිමිකමෙහි සිදුවන අඩුවීම වියදම් ලෙස හැඳින්වේ

(ල. 02)

(ii)

අ - ගැනිලි ගිණුම (හර) 5000
ගැනුම් ගිණුම (බැර) 5000

ආ - බැංකු ණය ගිණුම (හර) 25000
මුදල් ගිණුම (බැර) 25000 (ල. 1 x 2 = 02)

(iii) **ඔක් : 02**

01. බැංකු ණයක් ලබාගැනීම රු 100000
02. පිරිවැය රු 50000 ක් වූ භාණ්ඩ තොගයක් ණයට ගැනීම

ජංගම නොවන වත්කම් ණයට ගැනීම (මෙවැනි ගණුදෙණුවක් අගයන් සහිතව ලියා තිබුනහොත් නිවැරදිය) (ල. ½ x 2 = 01)

ඔක් : 03

01. අයිතිකරු ප්‍රාග්ධනය /අතිරේඛ ප්‍රාග්ධනය යෙදවීම රු 200000
02. අයිතිකරු තම පෞද්ගලික වත්කම් (ජංගම නොවන වත්කම්) ව්‍යාපාරයට යෙදවීම රු 500000 (ඉඩම් /මෝටර් රථ /ලී බඩු /ගොඩනැගිලි)
03. මුදලින් ලැබෙන ආදායම් රු 20000 (ගෙවල් කුලී ආදායම් /තැන්පතු පොලී ආදායම් /ආයෝජන ආදායම්)
04. සේවා විකුණුම් ආදායම් ලැබීම රු 50000

(ල. ½ x 2 = 01)

ඔක් : 04

01. බැංකු ණය වාරිකය ගෙවීම රු 50000 යි එහි ඇතුලත් පොලිය රු 5000

හෝ

රු 5000 ක පොලිය සමඟ බැංකු ණය වාරිකය ගෙවීම රු 50000

හෝ

බැංකු ණය රු 45000 ක් ද ඒ සඳහා පොලිය රු 5000 ක් ද ගෙවා දැමීම

(මේ ඕනෑම ආකාරයකට තිබිය හැක)

(ල. 01)

ඔක් : 05

01. අයිතිකරු සිය පෞද්ගලික මුදලින් ව්‍යාපාරයේ ණය හිමියන්ට මුදල් ගෙවීම රු 40000
02. අයිතිකරු සිය පෞද්ගලික මුදලින් ව්‍යාපාරයේ බැංකු ණය ගෙවා දැමීම රු 60000

(ඉහත ගණුදෙනුවල අගයන් වෙනස් විය හැක) (ල. 01)

(iv)

පොදු ජනලය

හර

දිනය	ජ. ව. අ	විස්තරය	ලෙ පි	හර (රු)	බැර (රු)
2023/10/1	01	ලී බඩු ගිණුම (හර) දම්රෝ සමාගම (23/10/01 දින දම්රෝ සමාගමින් රු 200000 ක් ව වටිනා ලී බඩු ණයට ගැනීම)		200000	200000

(ල. 02)

මහගම අධ්‍යාපන කලාපය

ලී බඩු ගිණුම බැර

(ල .1)

දිනය	විස්තරය	ස පි	වටිනාකම	දිනය	විස්තරය	ස පි	වටිනාකම
10/01	දම්රෝ සමාගම		200000				

හර දම්රෝ සමාගමේ ගිණුම බැර

දිනය	විස්තරය	ස පි	වටිනාකම	දිනය	විස්තරය	ස පි	වටිනාකම
					ලී බඩු ගිණුම		200000 (ල .1)

(ගිණුමේ ආකෘතිය අවශ්‍යයි. එසේ නොමැතිනම් ල 1/2 ක් අඩු කරන්න. තුලනය කිරීම අත්‍යාවශ්‍ය නැත)

(ල .04)

{ මුළු ලකුණු 02 x 4 = 8 }

මතුගම අධ්‍යාපන කලාපය

(06.)

(i)

හර　　　　　　　　　　　　සුළු මුදල් පොත　　　　　　　　　　　　බැර

ලැබීම් (රු)	මු.පෙ ා.ස .පි	දිනය	විස්තරය	ව අ	ගෙවීම් (රු)	විශ්ලේෂණ තීරු				වෙනත් ලෙජර ගිණුම්	ලෙ පි
						ගමන්	ලිපි ද්‍රව්‍ය	සංග්‍රහ	විවිධ		
500		23.9.1	ශේෂය/ඉ/ගෙ								
2500			මුදල් (අ .පු .පු කළා)								
		9.4	ගමන් වියදම්		320	320					
		9.6	ලිපි ද්‍රව්‍ය වියදම්		260		260				
		9.9	ගෙන ඒමේ කුලී		400					400	20
		9.12	සංග්‍රහ වියදම්		300			300			
		9.14	ත්‍රීරෝද රථ ගාස්තු		200	200					
		9.18	ගණක යන්ත්‍රයක් ගැනීම		600					600	22
		9.20	කාබන් කොළ මිලට ගැනීම		200		200				
		9.22	සංග්‍රහ වියදම්		150			150			
		9.24	පරිත්‍යාග කිරීම්		200				200		
		9.28	පෑන් පැන්සල් ගැනීම		150		150				
					2780	520	610	450	200	1000	
		9.30	ශේෂය/ප/ගෙ		220	ලෙ.පි 10	ලෙ.පි 12	ලෙ.පි 13	ලෙ.පි 15		
3000					3000						
220		23.10.1	ශේෂය/ඉ/ගෙ								
2780			මුදල් (අ .පු .පු කළා)								

(ල. ½) (ල. ½) (ල. ½) (ල. ½)

එක් සටහනකට ල.1/4 බැගින් උපරිම ල .2

(ල. 4)

(ii) අ

හර　　　　　　　　　　　　සංශෝධිත බැංකු ගිණුම　　　　　　　　　　　　බැර

දිනය	විස්තරය	ස පි	වටිනාකම	දිනය	විස්තරය	ස පි	වටිනාකම
23/9/30	ශේෂය/ඉ/ගෙ		50000		චෙක් පොත් ගාස්තු		500
	ණයගැති ප්‍රේෂණ		8000		බැංකු ගාස්තු		1000
					ස්ථාවර ගාස්තු		5000
				9/30	ශේෂය/ප/ගෙ		51500
			58000				58000
9/30	ශේෂය/ඉ/ගෙ		51500				

(ල. ¼ x 8 = 02)

ශේෂයන් ඇතුලත්ව එක් සටහනකට ලකුණු ¼ බැගින් හා දිනයට ලකුණු 1/4

ආ

සමනගේ ව්‍යාපාරය
2023 සැප්තැම්බර් මාසය සඳහා
බැංකු සැසඳුම් ප්‍රකාශය (විස්තරය)

	රු	රු	
2023/9/3 දිනයට සංශෝධිත බැංකු ශේෂය		51500	(ල. ½)
+ එකතු කළා			
නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් පත	7000	7000	(ල. ½)
		58500	
(-) අඩු කළා			
තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත	10000	(10000)	(ල. ½)
2023/9/30 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය		48500	(ල. ½)

(දිනය ඇතුළු සියළුම තොරතුරු ඇතුලත් විය යුතුය)

(iii) (ල. ½ x 4 = 02)

අ පොදු ජනලය

දිනය	ජ. වා. අ	විස්තරය	ලෙ පි	හර (රු)	බැර (රු)
23.09.30		දුරකතන වියදම් ගිණුම (හර) අවිනිශ්චිත ගිණුම (දුරකතන වියදම් ගෙවීම දුරකථන ගාස්තු ගිණුමේ රු 2700 ක් අඩුවෙන් සටහන් කිරීමේ වරද නිවැරදි කිරීම)		2700	2700
9.30		විදුලි වියදම් ගිණුම (හර) මුදල් ගිණුම (විදුලි වියදම් රු 4000 ගෙවීම ගිණුම්වල සටහන් නොවීමේ වරද නිවැරදි කිරීම)		4000	4000
9.30		ණයහිමි ගිණුම (හර) ගැනුම් ගිණුම (රු 6000 ක ගැනුම් ඉන්වොයිසිය ගිණුම් පොත්වල දෙවරක් සටහන් වීමේ වරද නිවැරදි කිරීම)		6000	6000

සංලක්ෂය සමඟ නිවැරදිව ජනල් සටහනට ල.1 බැගින් (ල. 03)

ආ

අවිනිශ්චිත ගිණුම

දිනය	විස්තරය	වටිනාකම	දිනය	විස්තරය	වටිනාකම
23/9/30	ශේෂය පිරික්සුමේ වෙනස	2700	9/30	දුරකතන වියදම් ගිණුම	2700
		2700			2700

ගිණුම තුලනය කර නොමැති නම් ල.1/2 කපන්න (ල. 1)

{ මුළු ලකුණු 12 }

07.

(i) අ - දළ ලාභය හෝ දළ අලාභය ගණනය කිරීම

ආ - ලාභාලාභ ගිණුම (හර) xxxx

ප්‍රාග්ධන ගිණුම (බැර) xxxx

(ල. 1 x 2 = 02)

(ii) <u>2023/09/30 සදුන්ගේ ව්‍යාපාරයේ හිමිකම</u>

			Re	
2023/9/1 දිනයට හිමිකම (ප්‍රාග්ධනය)			300000	ල. ½
+ **එකතු කලා**	: සැප්. මාසයේ ආදායම	150000		
	: සැප්. 25 යෙදූ මුදල	50000	200000	ල. ½
			500000	
- **අඩු කළා**	: සැප්. මාසයේ වියදම	60000		
	ගැනිලි – මුදල්	10000		
	භාණ්ඩ	5000	(75000)	ල. ½
2023/9/30 දිනට හිමිකම			425000	ල. ½

(ල. 02)

මතුගම අධ්‍යාපන කලාපය

(iii)

අ

රාජාගේ ව්‍යාපාරයේ

2022/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (ල. ½)

ලාභ හෝ අලාභ ප්‍රකාශනය

	රු	රු	රු	
විකුණුම්			700000	
(-) විකුණුම් පිරිවැය				
ගැනුම්		550000		
+ පැටවුම් කුලී		2000		
ගෙන ඒමේ කුලී		10000		
විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය		562000		
(-) 12/31 අවසන් තොගය (ඉතිරි තොගය)		(20000)		(ල. ½)
විකුණුම් පිරිවැය			(542000)	(ල. ½)
දළ ලාභය			158000	(ල. ½)
+ අමතර ආදායම්				
ලද වට්ටම්		6000	6000	
			164000	
(-) වියදම්				
බෙදා හැරීමේ වියදම්				
බොල් ණය	5000	(ල. ½)		
දුන් වට්ටම්	2000			
ප්‍රචාරණය	3000	10000		
පරිපාලන වියදම්				
විදුලි වියදම්	5000			
රක්ෂණය	6000			
ගොඩනැගිලි ක්ෂය	40000	(ල. ½)		
කාර්යාල උපකරණ ක්ෂය	10000	(ල. ½) 61000		
මූල්‍ය හා වෙනත් වියදම්				
බැංකු ණය පොලී	15000	15000	(86000)	
ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කළා			78000	(ල. ½)

(ල. 04)

ආ -

රාජාගේ ව්‍යාපාරයේ (ල. ½)

2022/12/31 දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ල. ½)

	පිරිවැය (රු)	සමු. ක්ෂය	ධාරණ අගය (රු)
<u>ජංගම නොවන වත්කම්</u>			
ගොඩනැගිලි	400000	40000	(ල. ½) 360000
කාර්යාල උපකරණ	100000	10000	(ල. ½) 90000
	500000	50000	450000
<u>ජංගම වත්කම්</u>			
12/31 අවසන් තොගය (ඉතිරි තොගය)		20000	(ල. ½)
ණයගැතියෝ (25000-3000)		22000	(ල. ½)
මුදල්		33000	75000
මුළු වත්කම්			525000
<u>හිමිකම් හා වගකීම්</u>			
<u>හිමිකම්</u>			
22/01/01 ප්‍රාග්ධනය		300000	
+ එකතු කළා - ශුද්ධ ලාභය		78000	(ල. ½) 378000
<u>ජංගම නොවන වගකීම්</u>			
15% බැංකු ණය		100000	100000
<u>ජංගම වගකීම්</u>			
ණය හිමියෝ		30000	
උපචිත බැංකු ණය පොලී		7000	(ල. ½)
බැංකු ශේෂය (බැංකු අයිරාව)		10000	47000
මුළු හිමිකම් හා වගකීම්			525000

(ල. 04)

**** වෙළඳ හා ලාභාලාභ ගිණුමේ ආකෘතියට සදා ශුද්ධ ලාභය සොයා තිබුණහොත් ලකුණු දිය යුතුය.**

{ මුළු ලකුණු 12 }

LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න